**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2019**
-----------------------------------------------------------------------------------------------------------

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එලඹි අංක.9186-එස් ආර්අයි(ඊඑෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතුයයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**
-----------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් සැපයුම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුර පලාතේ යාපනය ප්‍රදේශයේ කුඩා හුදකලා දූපත් 03 (නයනතිව්, අනලතිව් හා ඩෙල්ෆ්ට්) තුල වූ ග්‍රාමීය ප්‍රජාව සඳහා එලදායී බලශක්ති භාවිතයට සහය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා බාහිර මුදල් යෙදවීමට, ආසියානු සංවර්ධන බැංකුව අතර වූ ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 288 කට සමාන එජඩො මිලියන 2 ක් වන එම මුදල ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලබන දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිරිවැයෙන් රු.මිලියන 180.72 කට සමාන එජඩො මිලියන 1.26 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වෙන්කර තිබූ අතර රු.මිලියන 106.56 සමාන එජඩො මිලියන 0.74 ක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2017 මාර්තු 19 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

**1.3 තත්වාගණනය කළ මතය**
----------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**
-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | | | |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අන්තර්ගෙවීම් බිල්පත්‍ර අංක 06 මගින් වැඩ පූර්ව අත්තිකාරම් ලෙස අයකරගෙන තිබූ රු.මිලියන 12.09 මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. | 12.09 | කෙරීගෙන යන වැඩ ගිණුම අඩුවෙන් දැක්වීම හා වැඩ පූර්ව අත්තිකාරම් ගිණුම වැඩියෙන් දැක්වීම. | ව්‍යාපෘතිය විසින් දිනකට ඝණ මීටර් 75 ක මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත 02 ක් සැපයීම හා සවිකිරීම හා නයිනතිව් ජල සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම ඇතුළු සිවිල් වැඩ සැපයීම සඳහා යුනයිටඩ් ට්‍රැක්ටර් ඇන්ඩ් ඉක්විප්මන්ට් (පුද් ) සමාගම වෙත රු. 14,928,863.23 ක මුදලක් 2018 දෙසැම්බර් මාසයේදී ගෙවා තිබුණි. එයින් ව්‍යාපෘතිය 2020 පෙබරවාරි මාසයේදී අයිපිසි 06 මගින් අයකරගත් රු.12,090,149.41 ක මුදල හා 2020 අප්‍රේල් මාසයේදී අයිපිසි 07 මගින් අයකරගත් ඉතිරි රු.2,838,713.82 ක් වූ මෙම අයකර ගැනීමේ ගණුදෙනු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ව්‍යාපෘති මූල්‍ය | අයකරගත් අවස්ථාවේදීම ගිණුම් තැබීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ප්‍රකාශන තුළ ඉදිරිපත් කෙරේ. | |
| (ආ) | රු.මිලියන 1.9 ක විනිමය ලාභ ප්‍රමාණය මූල්‍ය ප්‍රභවයන් යටතේ වෙනම අයිතමක් ලෙස නිරූපණය කරනවා වෙනුවට ජංගම වගකීම් යටතේ වැරදි ලෙස දක්වා තිබුණි. | 1.9 | විනිමය ලාභ ප්‍රමාණය අඩුවෙන් දැක්වීම හා ජංගම වගකීම් වැඩිපුර දැක්වීම. | ව්‍යාපෘතියේ මූල්‍ය ගණුදෙනුවල දෛනික මෙහෙයුම් සඳහා ඩොලර් ගිණුම විවෘත කර ඇති නිසා, ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ අවසන් ශේෂය ජංගම වත්කම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල පෙන්නුම් කරන ලදී. 2019 දෙසැම්බර් 31 වර්ෂයේ අවසාන ශේෂය මාසික ඩොලර් නැවත ආගණනය කිරීමේ ලාභ අලාභයන්ගෙන් සමන්විත වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඩොලර් ගිණුමේ වර්ෂ අවසාන ශුද්ධ ශේෂය නැවත ආගණනය කිරීම් ලාභ හා අලාභය ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය ප්‍රභවයන් යටතේ විනිමය ලාභ ප්‍රමාණය වෙනම අයිතමයක් ලෙස පෙන්විය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | එකතුව රු.මිලියන 112.28 ක් වූ සිවිල් වැඩ, උපදේශණ සේවා සහ ව්‍යාපෘති පරිපාලන වියදම් වටිනාකම කෙරීගෙන යන වැඩ ලෙස නිරූපණය කරනවා වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ වැරදි ලෙස පෙන්වා තිබුණි. | 112.28 | කෙරීගෙන යන වැඩ අඩුවෙන් දැක්වීම හා ජංගම නොවන වත්කම් වැඩියෙන් දැක්වීම | ඒඩීබී ප්‍රදාන ගිවිසුම ජේඒෆ්පීආර් - 9186 - එස්ආර්අයි සහ ව්‍යාපෘති පරිපාලන අත්පොත (පීඒඑම්) අනුව, ව්‍යාපෘතියේ ජංගම නොවන වත්කම් සිවිල් වැඩ උපදේශන සේවය උපකරණ සහ ව්‍යාපෘති පරිපාලන ලෙස වර්ගීකරණය කර ඇත. ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දක්වා වූ ප්‍රාග්ධන වියදම් ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. සත්‍ය වශයෙන්ම මෙම ජංගම නොවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන තෙක් කෙරීගෙන යන වැඩ ලෙස පවතී. ව්‍යාපෘතිය මණ්ඩලය විසින් ප්‍රාග්ධනිත කිරීමෙන් පසුව මෙම ජංගම නොවන වියදම් අදාළ මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රාග්ධනිත වියදම් ලෙස පෙන්වනු ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වීමට පියවර ගත යුතුය. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ වටිනාකම සහ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම වටිනාකම අතර රු.මිලියන 78.48 ක වෙනසක් නිරීක්ෂණය විය. | 78.48 | ව්‍යාපෘති ගිණුම්වල සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ වටිනාකම් වෙනස් වීම. | ව්‍යාපෘතියේ කෙරීගෙන යන වටිනාකම සමඟ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අගය සමාන කිරීමට ව්‍යාපෘතිය කඩිනමින් පියවර ගනු ඇත. | ශේෂයන් සැසඳීම් කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

**3 භෞතික කාර්යය සාධනය**

**3.1 භෞතික ප්‍රගතිය**

| අංකය | ව්‍යාපෘති සංරචකය | 2019 දෙසැම්බර් 31 දිනට ඉලක්කගත | 2019 දෙසැම්බර් 31 දිනට තථ්‍ය | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | දිනකට ඝණ මීටර් 75 ක මුහුදු ජලය පිරිපහදු කිරීමේ පිරියත 02 ක් සැපයීම හා ස්ථාපනය කිරීම සමඟ අදාල සිවිල් වැඩ | 100 | 63 | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ හැකියාව | පිරියත ස්ථාපනය කිරීම අවසන්ය. පද්ධතිය භාර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් පිරියත ක්‍රියාත්මක කිරීම ක්‍රියාවට නංවා තිබිය යුතුය. | පිරියත ක්‍රියාත්මක කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | ටොන් 2 ක අයිස් සාදන කර්මාන්තශාලාවක් සහ ශීතකරණ පද්ධතියක් සැපයීම හා ස්ථාපනය කිරීම | 2019 සිව්වන කාර්තුව අවසානයේදී කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදනය කිරීම සහ ප්‍රදානය කිරීමේ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. | _ | කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීම ප්‍රමාද වීම. | ලංසු ලේඛණ සකස් කිරීම සිදුවෙමින් පවතී. කෙසේ වෙතත් අයිස් කම්හලේ මෙහෙයුම් කටයුතු රඳා පවතින්නේ විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් විදුලි පද්ධති ව්‍යාපෘතිය මඟින් නයනතිව් දූපතට ලබා දෙන විදුලි බල සැපයුම මතය. එබැවින් අයිස් සෑදීමේ කම්හල සඳහා ටෙන්ඩර් කැඳවීම විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘතිය අවසන් වූ විට කල හැකි වනු ඇත. | ව්‍යාපෘතියේ අයිස් සෑදීමේ කම්හල සඳහා විදුලිය සැපයීමට දෙමුහන් විදුලිබල පද්ධති ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ජා කල යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 63 ක් සහ සියයට 23.86 ක් විය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 02 කින් සමන්විත වූ අතර එයින් අයිස් සෑදීමේ කර්මාන්තශාලාව සහ ශීතකරණ පද්ධති කොන්ත්‍රාත්තුව සැපයීමේ සහ ස්ථාපනය කිරීමේ ප්‍රසම්පාදනය සහ ප්‍රදානය කිරීමේ කටයුතු 2019 දෙසැම්බර් සිව්වන කාර්තුව සහ 2020 දෙවන කාර්තුව අතර ආරම්භ කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2020 මැයි 31 වන දින දක්වා ලංසුකරුවන් සඳහා ආරාධනා කැඳවා නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීම ප්‍රමාද වීමේ හැකියාව | අයිස් කම්හලේ ක්‍රියාකාරීත්වය රඳා පවතින්නේ පවතින විදුලි සැපයුම මත වන අතර එය නයනතිව් දූපතට විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් විදුලිබල පද්ධති ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කළද තවමත් ආරම්භ කර නොමැත. | ව්‍යාපෘතියේ අයිස් සෑදීමේ කම්හල සඳහා විදුලිය සැපයීමට දෙමුහන් විදුලිබල පද්ධති ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කල යුතුය. |
| (ආ) | තුළමුව ළිං ඉදිකිරීම සඳහා වූ ඉඩම් නිෂ්කාශනය සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලිඛිත අවසර ලබාගත යුතු වේ. කෙසේ වුවද, 2020 මැයි 31 දින දක්වා එය ලබාගෙන නොතිබුණි. තවද, විගණනය වෙත ලබාදී ඇති ප්‍රගති වාර්තාවට අනුව 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු පනතේ III වන කොටසෙහි 14 (1) වගන්තියේ විධිවිධානයන්ට අනුව ඉදිකිරීම්වල ඉඩම් නිෂ්කාශනය සඳහා ලිඛිත අනුමැතියකින් තොරව 2020 මැයි 31 දින වනවිට තුළමුව | නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම. | 2017 සැප්තැම්බර් 22 වන දින වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලදී. පසුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඊළඟ සතියේම එම ස්ථානය නිරීක්ෂණය කර ඇත. පසුව අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා 2018 දෙසැම්බර් 28 දින ගෙවීම් කරන ලදී. පසුව 2019 ඔක්තෝම්බර් 15 වන දින පැවති ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමේදී, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිවිල් වැඩ හා ඉදිකිරීම් කර ගෙන යාම සඳහා අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව වැඩ නිම කරන ලදී. ලිඛිත අනුමැතිය ලබා ගැනීම සඳහා ව්‍යාපෘති කළමණාකරන | නීතිමය අවශ්‍යතාවය අනුකූලව කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ළිං තුනෙන් ළිං දෙකක් සම්පූර්ණ කර තිබුණි. | | ඒකකය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වී සිටී. ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් වාර්තාව මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 02 බලන්න) | |

**3.3 පද්ධති හා පාලන**

---------------------

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2010 ජූලි 26 දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05 ට අනුව, ව්‍යාපෘතියේ ගණුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයට භාජනය කර නොතිබුණි. | චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල නොවීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2020 මාර්තු මාසයට පෙර යාපනය කිලිනොච්චි ජල සැපයුම් හා සනීපාරක්ෂන ව්‍යාපෘතිය හා විදුලබල විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා විගණනය කිරීම සඳහා සැලසුම් කර තිබුණි. කොවිඩ් 19 හේතුවෙන්, අභ්‍යන්තර විගණකවරුන්ට ඔවුන්ගේ සැලසුම් අනුව ප්‍රවේශ වීමට නොහැකි විය. කෙසේ වෙතත්, මෙම විගණන මතය ඔවුන් සමඟ බෙදා ගැනීමෙන් ඔවුන් හැකි ඉක්මනින් විගණනය කර වාර්තාව ඉදිරිපත් කරනු ඇතැයි විශ්වාස කෙරේ. | චක්‍රලේඛ උපදෙස් වල අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |